චක්‍රලේඛ අංක : 11/ 2016

සමුපකාර සේවක කොමිෂන් සභාව(බ:ප:),
අංක 109 , හතර වන මහල,
මහ විදිය,
බත්තරමුල්ල.
2016.11.02

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සණස සමිති, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල සහ
අනෙකුත් සියලුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

**පේෂකර්ම සමුපකාර සමිතිවල තනතුරු සඳහා සුදුසුකම් ඇතිකිරීම.**

බස්නාහිර පළාතේ සියලුම පේෂකාර්මිකයින්ගේ සමුපකාර සමිතිවල යන්ත්‍ර ක්‍රියාකරු (පේෂකර්ම) සහ වැද්දුම්කරු (පේෂකර්ම) තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් අනුමත කරන බව කොමිෂන් සභාවේ නියමය පරිදි දන්වමි.

1) තනතුරේ නම : යන්ත්‍ර ක්‍රියාකරු (පේෂකර්ම)
වැටුප් පරිමාණ අංකය : 105:11
සේවා මට්ටම : කණිෂ්ඨ කාර්ය මණ්ඩලය
අවම වයස් සීමාව : අවුරුදු 18
උපරිම වයස් සීමාව : අවුරුදු 45

**තනතුර සඳහා අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

(අ) අටවන ශ්‍රේණියේ අධ්‍යාපන සහතිකය සමඟ තනතුරට අදාල පිළිගත් ආයතනයක යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ වසර දෙකකට නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබීම

**විශේෂ සුදුසුකම්**

- උස අවම වශයෙන් අඩි 05 ක්විය යුතුය.
- අත්යන්ත්‍ර හෝ බලවේග පේෂකර්මාන්තය පිළිබඳ දැනුම

2) තනතුරේ නම : වැද්දුම්කරු (පේෂකර්ම)
වැටුප් පරිමාණ අංකය : 105:10
සේවා මට්ටම : කණිෂ්ඨ කාර්ය මණ්ඩලය
අවම වයස් සීමාව : අවුරුදු 18
උපරිම වයස් සීමාව : අවුරුදු 45

**තනතුර සඳහා අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

(අ) 105:11 වැටුප් පරිමාණයේ අදාල ක්ෂේත්‍රයේ ස්ථිර තනතුරක අවු.02කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

(ආ) අටවන ශ්‍රේණියේ අධ්‍යාපන සහතිකය සමඟ රජයේ හෝ පිළිගත් ආයතනයකින් වැද්දුම්කරු ශිල්පය පිළිබඳ හයමසකට නොඅඩු පාඨමාලාවක් හදාරා සමත්වීම සමඟ අදාල තනතුරේ එක් වසරකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම